Department ... Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත්අධ්‍යාපනදෙපාර්තමේන්තුවසබරගමුව - සතිපාසල

විෂය : ගිණුම්කරණය

සතිය- 2

12 ශ්‍රේණිය

Prepared by - S. P. M. Prabath Susantha
Kuruwita Central College

**නිපුණතා මට්ටම 1.2** ගිණුම්කරණ පරිසර සාධකවල වෙනස්වීම් මත ගිණුම්කරණයේ වෙනස්වීම් හා ප්‍රවාණතා සිදුවන ආකාරය විග්‍රහ කරයි.

ව්‍යාපාරයක ගිණුම්කරණ ක්‍රියාවලියට බලපෑම් ඇතිකරනු ලබන විචල්‍යයන්ගෙන් සෑදුම්ලත් පරිසරය ගිණුම්කරණ පරිසරය ලෙස හැඳින්වේ.

පාරිසරික විචල්‍යයන් සැලකිල්ලට ගනිමින් , ගිණුම්කරණ පරිසරය "***ආර්ථික හා දේශපාලන***", "***සමාජ හා සංස්කෘතික***", "***ශිල්පීය හා වෘත්තීය***", "***නෛතික***" සහ "***තාක්ෂණික***" වශයෙන් කොටස් පහකට (05) බෙදා අධ්‍යයනය කළ හැකිය.

රජයක බදු ප්‍රතිපත්තිය , මිල මට්ටම, විනියම අනුපාත, පොලී අනුපාත, මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳ පොළ තත්ත්වයන් ආදිය ආර්ථික හා දේශපාලන පරිසරය යටතේ සලකනු ලබයි. ගිණුම්කරණ ප්‍රමිත, ගිණුම්කරණ වෘත්තීය ආයතන හා ගිණුම්කරණ ශිල්පක්‍රම ශිල්පීය හා වෘත්තීය පරිසර විචල්‍යයන් වේ. හවුල් ව්‍යාපාර අඥාපනත, සමාගම් පනත ආදියෙන් නෛතික පරිසරය සෑදුම්ලත් වෙයි. පාරිභෝගිකයින්ගේ මිලදී ගැනීමේ හුරුපුරුදු, ජීවන රටා, ජනගහනය ආශ්‍රිත උපනතීන් සමාජ හ සංස්කෘතික පරිසරය සේ සලකයි. තාක්ෂණික පාරිසරික විචල්‍යයන් සේ සලකනු ලබන්නේ තාක්ෂණික ක්‍රමවේද, තොරතුරු සන්නිවේදන තාක්ෂණය හා පරිගණක තාක්ෂණය ආදියයි.

**ඇගයිම**

පහතින් දක්වා ඇති ඒ ඒ සිදුවීම් ආර්ථික හා දේශපාලන, සමාජ සංස්කෘතික, ශිල්පීය හා වෘත්තීය, නෛතික, සහ තාක්ෂණික යන පරිසර සාධක වලින් කුමකට අයත් දැයි ඒ ඒ සිදුවීම ඉදිරියෙන් ඇති හිස්තැනෙහි ලියන්න.

| | සිදුවීම | පරිසර සාධකය |
|---|---|---|
| 1. | රජය විසින් ඛනිජ තෙල් මිල ඉහල දැමීම නිසාවෙන් බොහෝ ව්‍යාපාරයන්හි ප්‍රවාහන වියදම් ඉහල යාම. | .......................................... |
| 2. | ත්‍රිරෝද රථ හා ටැක්සි මුදල් නෝට්ටු වෙනුවට"QR code" (QR කේතය) භාවිතයෙන් අයකිරීම් කිරීමට යොමු වීම. | .......................................... |
| 3. | විනියම අනුපාතය ඉහළ යාම හේතුවෙන් තේ අපනයන කරුවන්ගේ අදායම් තත්ත්වය ඉහළ යාම. | .......................................... |
| 4. | ශ්‍රී ලංකා වරලත් ගිණුම්කරණ ආයතනය නව මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයක් හඳුන්වා දීම . | .......................................... |
| 5. | පාරිභෝගිකයන් වැඩි ප්‍රමාණයක් SELFI (සෙල්ෆි) දුකරථන වලට වැඩි කැමැත්තක් දැක්වීම නිසා දුරකථන සාමාගම් වැඩි වශයෙන් ඒවා නිපදවීමට යොමුවීම. | .......................................... |
| 6. | සෑම මූල්‍යායතනයක්ම මාසික ගිණුම් වාර්තාවක් ශ්‍රී ලාංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කළයුතු බව රජය විසින් තීරණය කිරීම. | .......................................... |
| 7. | පාසල් සිසුන් වැඩි ප්‍රමාණයක් අන්තරජාලය භාවිතයට හුරුවීම නිසාවෙන් දුරකථන සමාගම් වල අදායම් ඉහල යාම. | .......................................... |
| 8. | පහසුව හා කාර්යක්ෂමතාවය නිසාවෙන් බොහෝ ව්‍යාපාරය ගිණුම්කරණය සඳහා පරිගණක මෘදුකාංග භාවිත කිරීම. | .......................................... |